# මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය - 2021/2022

- 2021/2022 අධ්‍යයන වර්ෂයට අදාල මහපොළ ශිෂ්‍යත්වලාභී සිසුන්ගේ නාම ලේඛනය ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ (welfare.sjp.ac.lk) පළ කර ඇත.
- මහපොළ ශිෂ්‍යත්වය සඳහා තේරී පත්වී ඇති මෙම සිසුන් ඒ සඳහා ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි වීමේ ආකෘති පත්‍රය www.mahapola.lk වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැදුනුම්පත් අංකය භාවිතා කිරීමෙන් ලබාගත හැකිය.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත සෘජුවම (online) මහපොළ අරමුදල වෙත 2024.07.30 දිනට පෙර යොමු කළ යුතුය.
- **ඔබ බාගත කරන ලද ආකෘති පත්‍රයේ පිටපතක් ඔබේ අත්සන යොදා ලියාපදිංචි අංකය පැහැදිලිව සටහන් කර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සුබසාධක අංශය වෙත 2024.08.05 දිනට පෙර බාර දිය යුතුය. බැංකු පාස් පොතේ පැහැදිලි ඡායා පිටපතක් හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඒ සමග අමුණා තිබිය යුතු වේ.** ( E - පාස්පොත් ඇති සිසුන් තම ගිණුමට අදාල තොරතුරු සනාථ කිරීම සඳහා බැංකුවෙන් ලබාගන්නා ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය).

◆ **මෙම ගිණුම මහපොළ ශිෂ්‍යත්වලාභියාගේ නමට අයත් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ගිණුමක් විය යුතු අතර බද්ධ ගිණුමක් නොවිය යුතුයි.**

◆ **ඔබ විසින් ලබා දෙන බැංකු ගිණුම් අංකය පසුව වෙනස් කළ නොහැකි අතර සක්‍රීය ගිණුම් අංකයක් ඉදිරිපත් කළ යුතුවේ.**

◆ **ගිණුම් අංකය පසුව වෙනස් කරනු ලබන සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් මහපොළ ශිෂ්‍යත්වභාර අරමුදල විසින් අත්හිටුවනු ලබයි.**

නියෝජ්‍ය ලේඛකාධිකාරි
ශිෂ්‍ය සුබසාධක අංශය
2024.07.23

**නියෝජ්‍ය ලේඛකාධිකාරි**
**ශිෂ්‍ය සුභසාධක අංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**ගංගොඩවිල - නුගේගොඩ.**